විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩලය අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විද්‍යායතනයේ කළමනාකරණ මන්ඩලය නොදනී.

2.1.4 ගනුදෙනු කරන ව්‍යවහාර මුදල

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

2.1.5 ඇස්තමේන්තු සහ තීණ්දු භාවිතා කිරීම

අදාළ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරීත්වය මඟින් ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වත්කම් හා වගකීම්වලට, ආදායම හා වියදමට වාර්තා කළ අගයන්ට බලපාන තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇති කර ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් හා පවතින තත්ත්වයන් යටතේ යුක්තිසහගත බවට විශ්වාස කරන විවිධ වෙනත් සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පන කෙරී ගෙන යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ.

2.2. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත පරිහානිය සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගනනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති සාදාරණ වටිනාකමට ප්‍රත්‍යාගනනය කරනු ලැබේ. ප්‍රමාණාත්මක විධිමත්භාවයක් ඇතිව ප්‍රත්‍යාගනනය සිදු වේ. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් සෘජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

(ආ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත.

විස්තරය	**වර්ෂ**
ගොඩනැගිලි	20
ගෘහභාණ්ඩ හා තිරවුරු	10
උපකරණ	10
කාර්යාල උපකරණ	05
මෝටර් වාහන	05
පුස්තකාල පොත් සහ වාරසඟරා	05
විද්‍යාගාර, ශික්ෂණ උපකරණ	05

වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථිර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

(ඇ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විද්‍යායතනයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

(ඈ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගිම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

2.2.2 අස්පර්ශණීය වත්කම්

විද්‍යායතනයේ අස්පර්ශණීය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විද්‍යායතනයට ගලා එන්නේ නම් පමණක් අස්පර්ශණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර අස්පර්ශණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.2.3 ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ.

ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

2.2.4 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ.

භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

2.2.5 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් සහ කෙටි කාලීන තැන්පතුවලට බැංකුවේ ඇති මුදල්, අතැති මුදල් සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් නොවැදගත් අවදානමක් ඇති මාස තුනක් හෝ ඊට අඩු කල් පිරීමක් ඇති කෙටි කාලීන තැන්පතු ඇතුළත් වේ.

වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විද්‍යායතනයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය මත පදනම්ව සකස් කරනු ලබන අතර මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවේ ඇති තැන්පතු ඇතුළත් වේ.

2.2.6 විවිධ ණයකරුවෝ

"ණය" යන්නෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් හැඳින්වේ. මෙම ණය නිකුත් කරනු ලබන්නේ ඇපයක් මතය. තව ද ණය ශේෂයන් සේවකයාගේ මාසික වැටුපෙන් අය කරනු ලැබේ. සේවකයා සේවය අතහැර යන අවස්ථාවක දී එවැනි මුදල් අගයන් සේවකයාගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සම්පූර්ණයෙන්ම ආපසු අය කර ගනු ලැබේ. එබැවින් බොල් ණය ආපසු අය කර ගැනීම සඳහා විධිවිධාන නොමැත.

2.2.7 කෙටි කාලීන ආයෝජන

මාස තුනක හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන තැන්පතු නියෝජනය කරන සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් වැදගත් නොවන අවදානමකට භාජනය වන කෙටි කාලීන ආයෝජන ලැබෙන පොළිය සහ පිරිවැය මත සලකා බලනු ලැබේ.

2.2.8 පොදු සංචිතය

පොදු සංචිතයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ ඇතුළත් වේ. පසුගිය වසරට අදාළ රු. 805,652/-ක මුදලක් වර්ෂය තුළ දී පොදු සංචිතයට හර කර ඇත.

2.2.9 සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

සීමා කළ අරමුදල් සහ ප්‍රදාන පර්යේෂණ ප්‍රදාන සහ විශේෂිත කාර්යයන් සඳහා වෙන් කර ඇති ලැබූ වෙනත් ප්‍රදාන නිරූපණය කරයි.

2.2.10 සේවක ප්‍රතිලාභ

(i) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

විද්‍යායතනය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ. අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම සිදු කර ඇත.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති **(SLPAS 19)** අනුව අදාළ වන පරිදි ඉහත නිර්මිත ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් විධිවිධාන පළමු වරට යොදා ගැනීම 2019 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ සිට සිදු කරනු ඇත.

(ii) නිර්මිත දායකත්ව සැලසුම්

විද්‍යායතනයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විද්‍යායතනය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විද්‍යායතනය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

2.2.11 **ආදායම හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභ විද්‍යායතනයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට ආදායම හඳුනා ගනී.

ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු සහ වෛද්‍ය ගාස්තු ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා ගාස්තු වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. පොළී ආදායම සහ කුළී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන අදාළ පිරිවැය හඳුනා ගත් කාලපරිච්ඡේදය තුළ ආදායම ලෙස හඳුනා ගනී.

පසු කාලීන කාලපරිච්ඡේදවල දී වියදම් කරන වත්කම් අත්කර ගැනීමට උපයෝජනය කළ රජයේ ප්‍රදාන විලම්භිත ආදායම (වියදම් නොකළ ප්‍රාග්ධනය) ලෙස හඳුනා ගනී. මුදල් හා මුදල් සමාන දෑ, අඩු වගකීම් (ලැබූ ප්‍රදාන සම්බන්ධ වගකීම් හැරුණු කොට) ඇතුළු වෙනත් වත්කම්වලින් නිරූපණය කරන රජයේ ප්‍රදාන වගකීම් ලෙස හඳුනා ගනී. විලම්භිත ආදායම ලෙස හඳුනා ගන්නා රජයේ ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාලය අවසානයේ දී ක්‍රමක්ෂය කර ඇත.

2.2.12 වියදම හඳුනා ගැනීම

විදයම් දැරූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල හඳුනා ගනු ලැබේ. ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙනයාමේ දී දැරූ සියලුම වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා විද්‍යායතනයේ කාර්යසාධනයේ ලක්ෂණ සාධාරණය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් කටයුතු" ක්‍රමය යොදා ගෙන ඇත.

ට්‍රාන්ස්පෝමරය සවි කිරීම සඳහා 2008 සහ 2009 වර්ෂවල දී දැරූ රු. 1,531,372.00ක් සහ රු. 993,618.00ක් වූ වියදම් වර්ෂයකට 10%ක අනුපාතයට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

2014 වර්ෂයේ දී පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා දැරූ රු. 163,638.46ක ප්‍රාග්ධන වියදම වර්ෂයකට 20%ක අනුපාතයට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

2.2.13 ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

කොන්ත්‍රාත්කරුවෙක් විසින් කොන්ත්‍රාත්තුවක් යටතේ ඔහුට මුදල් ගෙවිය යුතු බවට පවසමින් කොළඹ වාණිජ මහාධිකරණයේ ගොනු කර ඇති නඩු කටයුත්තක් විභාග වෙමින් ඇත. බැඳීම නිරවුල් කිරීම සඳහා සම්පත් ගලා ඒමක් අවශ්‍ය නොවන බැවින් ප්‍රතිපාදන දක්වා නොමැත. ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු විශේෂ පාලන ගිණුමක් හරහා නිදහස් කිරීමට පියවර ගෙන ඇති අතර 2018 දෙසැම්බර් ස 31වැනි දින වන විට එකී ගිණුමේ රු. 6,488,942.18ක මුදල් තිබුනි.

(2012 වර්ෂයේ දී නිමා කළ) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ අවසාන බිල්පත මේ වන තෙත් විද්‍යායතනයට ලැබී නොමැත. ඉහත ව්‍යාපෘතිය සඳහා එකී දිනය දක්වා දැරූ ඉදිකිරීම් පිරිවැය සුදුසු පරිදි ගණනය කර ක්ෂය කර ඇත.

2.2.14 වාර්තාකරණ දිනට පසුව සිදුවීම්

වාර්තාකරන දිනට පසු එන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශන සටහන්වලට නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

2.2.15 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

මෙම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් ගන්නා කිසියම් තීරණයකට යුක්තිසහගතව බලපෑම් කළ හැකි කිසිදු වැදගත් ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනුවක් වර්ෂය තුළ දී සිදු වී නොමැත.

2.2.16 බදු අය කිරීම්

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7 (ආ) වගන්තිය අනුව විද්‍යායතනය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
මූල්‍ය ප්‍රකාශන - 2018

		රු.	රු.
සටහන - 02			
මුදල් හා මුදල් සමාන දෑ		**2018**	**2017**
බැංකු ශේෂය			
ගිණුම් අංක 333-1001-1-0000059		824,089	26,330,960
ගිණුම් අංක 333-1002-0-0000059		9,682,321	9,858,004
එකතුව		**10,506,410**	**36,188,964**
සටහන - 03			
විවිධ ණයගැතියෝ		**2018**	**2017**
ණයගැතියෝ		-	10,868
ශිෂ්‍යාධාර		104,430	
මහපොළ ශිෂ්‍යත්වය		55,100	159,530
එකතුව		**159,530**	**170,398**
සටහන - 04			
ණය හා අත්තිකාරම්		**2018**	**2017**
ආපදා ණය		19,737,450	19,623,793
කාර්ය මණ්ඩල ණය		202,130	224,060
වාහන ණය		1,035,696	834,730
පරිගණක ණය		651,700	790,700
විදේශ ආපදා ණය (මාස දෙකක්)		438,808	295,253
උත්සව අත්තිකාරම්		21,250	38,750
විශේෂ අත්තිකාරම්		-	2,000
එකතුව		**22,087,034**	**21,809,286**
සටහන - 05			
ගබඩා අත්තිකාරම්		**2018**	**2017**
ගබඩා අත්තිකාරම් ගිණුම (භාණ්ඩ ලැයිස්තුව)		1,404,549	1,214,173
එකතුව		**1,404,549**	**1,214,173**
සටහන - 06			
පෙර-ගෙවීම්		**2018**	**2017**
වසර අවසානයේ දී		338,966	86,570
එකතුව		**338,966**	**86,570**
සටහන - 07			
වෙනත්		**2018**	**2017**
තැන්පතු - ඉන්ධන		138,500	138,500
ආහාර		3,000	3,000
විදුලිය		511,395	511,395

ගෑස් සිලින්ඩර		43,768	43,768
ජලය		195,000	115,000
ඩයලොග් රූපවාහිනිය		18,000	-
ලැබිය යුතු ආපනශාලා ගාස්තු		500	1,500
ආයෝජනවලින් ලැබිය යුතු පොලිය		1,632,387	1,527,421
ඖෂධවේදය පිළිබඳ IIIවැනි ඩිප්ලෝවෙන් ලැබිය යුතු *		30,693	30,693
ශල්‍යතන්ත්‍රය පිළිබඳ IIIවැනි ඩිප්ලෝවෙන් ලැබිය යුතු *		6,716	-
2018/2019 කායචිකිත්සාව පිළිබඳ IIIවැනි ඩිප්ලෝවෙන් ලැබිය යුතු		20,501	-
2018/2019 විද්‍යාපති උපාධියෙන් ලැබිය යුතු		2,216	
එකතුව		**2,602,675**	**2,371,276**
* සටහන			
පාඨමාලා සඳහා දැරූ මුල් වියදම (දැන්වීම් වියදම) පාඨමාලා ආරම්භ කළ විට ආපසු අය කර ගැනීමට නියමිතය.			

සටහන - 08 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය/ ගණනය කිරීම

<u>සින්නක්කර වත්කම්</u>

	ඉඩම	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ	ගෘහ භාණ්ඩ හා තිරවුරු	පුස්තකාල පොත් හා වාරසඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	එකතුව
2018.01.01 දිනට ශේෂය	72,126,250	318,333,332	41,129,761	49,557,153	29,455,633	14,784,158	19,765,000	18,502,859	**563,654,147**
									-
එකතුව	-	7,869,959	4,220,957	1,896,120	1,794,312	196,124	241,690	2,208,319	**18,427,480**
WIPවලින් මාරු කිරීම්									**-**
ගැලපීම්		(26,236)							**(26,236)**
ප්‍රත්‍යාගණනය									-
2018.12.31 දිනට ශේෂය	**72,126,250**	**326,177,055**	**45,350,718**	**51,453,273**	**31,249,945**	**14,980,282**	**20,006,690**	**20,711,178**	**582,055,391**

සමුච්චිත ක්ෂයවීම්

	ඉඩම්	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ	ගෘහ භාණ්ඩ හා තිරවුරු	පුස්තකාල පොත් හා වාරසඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	එකතුව
2017.01.01 දිනට ශේෂය	-	78,692,982	25,432,909	42,227,695	17,230,136	14,257,497	9,980,130	8,504,871	**196,326,220**
වර්ෂය සඳහා අය කළ	-	15,976,788	6,390,270	3,461,847	2,999,263	662,485	1,868,941	1,933,908	**33,293,502**
ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම								-	**-**
2018.12.31 දිනට ශේෂය	-	**94,669,770**	**31,823,179**	**45,689,542**	**20,229,399**	**14,919,982**	**11,849,071**	**10,438,779**	**229,619,723**
2017.12.31 දිනට ධාරක වටිනාකම	72,126,250	78,692,982	25,432,909	42,227,695	17,230,136	14,257,497	9,980,130	8,504,871	**268,452,470**
2018.12.31 දිනට ධාරක ශේෂය	**72,126,250**	**231,507,286**	**13,527,539**	**5,763,731**	**11,020,545**	**60,300**	**8,157,619**	**10,272,399**	**352,435,668**

සටහන්

1. ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කරන බලපත්‍රලාභී තක්සේරුකරුවෙක් විසින් ස්වාධීනව තක්සේරු කර ඇත. අනෙක් සියලුම වත්කම් වරලත් ගණකාධිකාරීවරයෙක්, තාක්ෂණික නිලධාරියෙක්, බලපත්‍රලාභී තක්සේරුකරුවෙක් ගෙන් සැදුම්ලත් වෘත්තිකයින් මණ්ඩලයක් මඟින් 2009 දෙසැම්බර් 06වැනි දින ප්‍රත්‍යාගණනය කර ඇත. විද්‍යායතනයේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2016 වර්ෂයේ දී රු. 331,700,000.00කට ප්‍රත්‍යාගණනය කර ඇත. කෙසේවුව ද, ඉඩම් හා ගොඩනැගිලි අතර වටිනාකම් බෙදීමක් නොමැති බැවින් එය ගිණුම්ගත කර නොමැත.
2. 2015 ජුනි මස 30වැනි දින මෝටර් රථ වාහන සියලුම පන්තිය තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නැවත අගය කරන ලද අතර මෙම වටිනාකම් එම වසරේදීම ගිණුම්ගත කර ඇත.
3. වර්ෂය තුළ දී උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් 2018.08.20 වැනි දින ලැබූ මෝටර් රථය ඇතුළු සියලුම මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලෙසට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදී. කෙසේවුව ද, මූල්‍ය ප්‍රකාශන සකස් කරන දිනය වන තෙක්ම ප්‍රත්‍යාගණන වටිනාකම් ලැබී නොතිබුනි.
4. බැහැර කිරීමේ ක්‍රියාවලිය මෙතෙක් සම්පූර්ණයෙන්ම නිමා කර නොමැති බැවින් මූල්‍ය වර්ෂය අවසානයේ දී බැහැර කළ අයිතම ගලපා නොමැත. තව ද, මෙම අයිතම බොහොමයක් වර්ෂය අවසානයේ දී සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත.

	රු.	රු.
සටහන - 09		
<u>කෙරී ගෙන යන වැඩ</u>	**2018**	**2017**
පරිපාලන ගොඩනැගිල්ල - 1වැනි අදියර	59,886,587	58,730,855
ශිෂ්‍ය කේන්ද්‍රීය ගොඩනැගිල්ල	46,751,269	36,154,302
අධ්‍යයන ගොඩනැගිල්ල	19,312,951	15,643,812
කාන්තා නේවාසිකාගාරය	572,000	572,000
පරිපාලන ගොඩනැගිල්ල - 11වැනි අදියර	8,943,645	1,155,733
එකතුව	**135,466,452**	**112,256,701**
සටහන -10		
<u>අස්පෘෂ්‍ය වත්කම්</u>	**2018**	**2017**
ආරම්භයේ දී ශේෂය	423,200	331,600
වසර තුළ දී එකතු කිරීම්	136,600	91,600.00
එකතුව	**559,800**	**423,200.00**
සටහන -11		
<u>වෙනත් වත්කම්</u>	**2018**	**2017**
ට්‍රාන්ස්පෝමරයේ පිරිවැය	-	99,461
පර්යේෂණ ශක්තිමත් කිරීම	-	163,638
එකතුව	**-**	**263,099**
සටහන -12		
<u>උපචිත වියදම්</u>	**2018**	**2017**
විදුලි බලය	140,000	437,000
ජලය	175,000	119,400
දුරකථන	719,500	435,500
වෙනත් පුනරාවර්තන	224,100	91,000
බාහිර කථිකාචාර්ය ගාස්තු	250,000	50,000
ඉන්ධන	102,000	125,500
ගමන්	3,000	2,200
අතිකාල	372,600	587,300
විභාග ගාස්තු	225,000	50,000
සංග්‍රහ දීමනා	58,500	11,100
නඩත්තු වියදම් - වාහන	350,000	100,000
සුරැකුම්පත්	1,262,447	800,000
පුවත්පත්	83,000	100,000
නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර	3,500	-
පිරිසිදු කිරීමේ සේවා	570,000	375,000
ප්‍රවාහනය	3,200	-
වැටුප්	76,000	53,000
එකතුව	**4,617,847**	**3,337,000**
සටහන -13		
<u>කළ යුතු ගෙවීම්</u>	**2018**	**2017**
විවිධ ණයකරුවෝ	1,333,823	670,808
ගෙවි යුතු	-	-
එකතුව	**1,333,823**	**670,808**

	රු.	රු.
සටහන -14		
ආපසු ගෙවිය යුතු තැන්පතු සහ වෙනත්	**2018**	**2017**
ආපසු ගෙවිය යුතු තැන්පතු	5,000	5,000
විවිධ තැන්පතු	2,017,004	1,582,903
නොගෙවූ වවුචර	18,350	
වෙනත්		
රඳවා ගැනීම්	13,076,434	15,744,569
විද්‍යාපති කොටස් 11 2010/2011		
යෝග V ඩිප්ලෝමාව	15,000	488,500
යෝග VI ඩිප්ලෝමාව	738,833	
රූපලාවන්‍ය පිළිබඳ ඩිප්ලෝමාව VIII	-	19,050
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XVI	-	-
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XVII	-	-
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XVIII	-	19,800
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXII	5,000	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXIII	388,000	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXIV	43,000	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXV	91,183	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXVI	11,000	-
රූපලාවන්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව VIII	-	-
විද්‍යාපති 2013/2014	481,000	707,550
විද්‍යාපති 11 කොටස 2013/2014	461,052	461,052
විද්‍යාපති පංචකර්ම 2013/2014	1,767,706	1,879,973
විද්‍යාපති කායචිකිත්සාව 2013/2014	1,049,629	1,159,829
පංචකර්ම ඩිප්ලෝමාව - 2015	3,194,693	3,339,893
ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව -11	513,257	518,257
පංචකර්ම ඩිප්ලෝමාව - 2016/2017	2,611,400	3,296,400
කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2016/2017	2,435,170	3,111,900
කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2015	1,195,757	1,504,807
ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව - 2016/2017	1,860,204	4,011,675
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XIX	-	23,650
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XX	-	207,500
යෝග සහතිකපත්‍ර පාඨමාලාව XXI	113,000	33,000
කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2017/2018	1,884,783	1,438,950
පංචකර්මය ඩිප්ලෝමාව - 2017/2018	2,039,747	1,698,080
පංචකර්මය ඩිප්ලෝමාව - 2018/2019	2,404	-
එම්. ඒ. ඒ. අයි. පිළිබඳ ඩිප්ලෝමාව - 2018/2019	59,864	-
විද්‍යාපති කායචිකිත්සාව 2017/2018	4,000	4,000
වෛද්‍ය රක්ෂණය	-	2,755
විගණන ගාස්තු සඳහා විධිවිධාන	1,059,644	1,160,651
රඳවා ගැනීමේ බද්ද	16,500	-
එකතුව	**37,158,615**	**42,419,745**
සටහන - 15		
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	**2018**	**2017**
ආරම්භයේ දී ශේෂය	63,307,411	53,538,130
වසර සඳහා ගාස්තුව	13,272,312	11,576,307
වසර සඳහා ගෙවීම	(4,791,137)	(1,807,026)
එකතුව	**71,788,586**	**63,307,411**

	රු.	රු.
සටහන - 16		
<u>සීමා කළ අරමුදල් සහ ප්‍රදාන</u>	**2018**	**2017**
NCAS පර්යේෂණ අරමුදල - වෛද්‍ය බන්දුල වීරසූරිය	-	8
NCAS පර්යේෂණ අරමුදල - වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එල්. චන්ද්‍රසිරි	111,299	111,299
දර්ශනශූරි පර්යේෂණ - වෛද්‍ය එච්. පී. වක්කුඹුර	109,000	109,000
දර්ශනශූරි පර්යේෂණ - ජේ. එම්. පී. ආර්. කේ. ජයසිංහ	-	4,099
දර්ශනශූරි පර්යේෂණ - වෛද්‍ය එච්. ඒ. ආර්. පී. පෙරේරා	-	82,110
ජේ. පී. වික්‍රමාරච්චි පරිසංවාදය	1,371,638	1,329,388
සංවර්ධන ප්‍රථම උපාධි වැඩසටහන	1,214,142	1,214,142
ත්‍රෛභාෂා අරමුදල	275,700	436,200
පියසීලී වික්‍රමාරච්චි ජයසේකර	456,829	408,969
ත්‍යාග හා ප්‍රදාන	11,290,088	11,575,540
ක්‍රීඩා අරමුදල	314,540	314,540
පර්යේෂණ අරමුදල	1,331,617	874,875
අධ්‍යක්ෂකගේ අරමුදල	472,400	482,400
ජී. එස්. ඩී. සංවර්ධන ක්‍රියාකාරකම්	128,035	50,000
මායිම් තාප්පය සඳහා වන්දි *1	1,599,000	1,599,000
විශ්වවිද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා අග්‍රිමය		700,000
සංවර්ධන අරමුදල	10,000	
වෛද්‍ය ලීලාරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය	100,875	
ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය	60,538	
වෛද්‍ය සිසිර වික්‍රමාරච්චි ශිෂ්‍යත්වය	200,000	
එකතුව	**19,045,700**	**19,291,569**

*1 විද්‍යායතනයට මායිම් තාප්පය සඳහා වන්දි ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු. 1,599,000/-ක් ලැබුනි. මායිම් තාප්පය නැවත ඉදිකිරීම සඳහා 2017 වර්ෂය තුළ දී නව කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලද අතර ගෙවීමට ඇති බිල්පත් නිරවුල් කළ පසුව මෙම කාර්ය සඳහා ලැබූ මුදල් උපයෝජනය කරනු ලැබේ.

සටහන - 17		
<u>ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය සහ වෙනත්</u>	**2018**	**2017**
ස්ථාවර වත්කම්	141,060,834	141,060,834
මෝටර් වාහන ප්‍රත්‍යාගනන සංචිතය	11,370,270	11,370,270
ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීමේ අරමුදල	2,432,959	3,422,959
	154,864,062	**155,854,062**
සටහන - 18		
<u>විවිධ ලැබීම්</u>	**2018**	**2017**
විවිධ ආදායම	248,003	504,619
ලියාපදිංචි ගාස්තුව (සැපයුම්කරුවන්)	191,000	206,000
එකතුව	**439,003**	**710,619**

	රු.	රු.
සටහන - 19		
<u>දේපළ කුලිය</u>	**2018**	**2017**
ආපනශාලාවලින් කුලිය	6,500	22,100
දේපළවලින් කුලිය	341,445	382,000
එකතුව	**347,945**	**404,100**
සටහන - 20		
<u>ශිෂ්‍යාධාර ආදායම (ශුද්ධ)</u>	**2018**	**2017**
ශිෂ්‍යාධාරවලින් ලැබීම්	3,309,930	5,764,430
ශිෂ්‍යාධාර ගෙවීම්	(3,309,930)	(5,764,430)
මහපොළින් ලැබීම	3,760,650	6,035,000
මහපොළ ගෙවීම්	(3,760,650)	(6,035,000)
ශුද්ධ	-	-

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
ව්‍යාපෘති සහ වැය විෂය අනුව වැඩසටහන් වියදම - 2018

කේත අංකය	විස්තරය	සාමාන්‍ය පරිපාලනය 01-01	මූල්‍ය පරිපාලනය 01-02	අධ්‍යයන සේවා 02-11	ශික්ෂණ සම්පත් 03-01	එකතුව
01	**පුද්ගලික වැටුප්**					
01	පුද්ගලික වැටුප්-අධ්‍යයන					
01.01	වැටුප් හා වේතන	-	-	28,061,602.14	897,786.17	28,959,388.31
01.02	යූ. පී. එෆ්.	-	-	6,990,962.21	149,485.32	7,140,447.53
01.03	විශ්‍රාම වැටුප්	-	-	2,730,892.05	170,840.33	2,901,732.38
01.04	සේ.අ.අ.	-	-	1,939,798.64	64,065.13	2,003,863.77
01.05	වැඩ බැලීමේ ගෙවීම්	-	-	-	-	-
01.06	අධ්‍යයන දීමනා	-	-	34,630,598.20	1,144,167.51	35,774,765.71
01.07	සම කිරීමේ දීමනා	-	-	-	-	-
01.08	ජීවන වියදම් දීමනාව	-	-	3,166,800.00	93,600.00	3,260,400.00
01.09	වෙනත් දීමනා	-	-	57,935.49	-	57,935.49
01.10	භාෂා ප්‍රවීණතා දීමනාව	-	-	-	-	-
01.11	බාහිර කථිකාචාර්ය ගාස්තු	-	-	1,809,119.74	-	1,809,119.74
01.14	පාරිතෝෂික	-	-	-	-	-
01.15	වෙනත් දීමනා 5%	-	-	-	-	-
01.16	පර්යේෂණ දීමනා	-	-	8,193,582.75	265,204.39	8,458,787.14
01.17	සංග්‍රහ දීමනා			-	-	-
01.18	දේපළ ණය			315,416.22	-	315,416.22
01.19	20% දීමනාව			4,688,385.18	151,545.37	4,839,930.55
01.22	දීමනාව 10000			(1,055.14)	-	(1,055.14)
2	**පුද්ගලික වැටුප්-අනධ්‍යයන**					
02	පුද්ගලික වැටුප්				-	-
1.02.01	වැටුප් හා වේතන	24,630,296.82	7,479,840.55	18,872,482.15	3,676,460.12	54,659,279.64
1.02.02	යූ. පී. එෆ්.	3,650,693.08	1,242,748.31	2,946,905.75	688,950.90	8,529,298.04
1.02.03	විශ්‍රාම වැටුප්	1,701,904.81	471,931.46	1,257,229.45	175,095.88	3,606,161.60
1.02.04	සේ.අ.අ.	1,052,626.96	339,199.49	843,179.46	172,680.92	2,407,686.83
1.02.05	වැඩ බැලීමේ ගෙවීම්	-	-	-	-	-
1.02.08	ජීවන වියදම් දීමනාව	4,309,293.91	1,864,902.12	4,169,271.33	879,387.10	11,222.854.46
1.02.09	වෙනත් දීමනා	550,623.20	22,217.40	69,800.00	1,200.00	643,840.60
1.02.12	අතිකාල දීමනා	5,968,232.49	276,262.63	-	476,624.63	6,721,119.75
1.02.13	නිවාඩු ගෙවීම්	6,495.90	-	-	-	6,495.90
1.02.14	පාරිතෝෂික	13,272,311.94	-	-	-	13,272,311.94
02.15	5% වෙනත් දීමනා	-	-	-	-	-
02.16	පර්යේෂණ දීමනා	253,008.70	264,554.85	-		517,563.55
02.17	දේපළ ණය	550,510.89	97,252,61	61,817.67	98,198.51	807,779.68
02.18	20% දීමනාව	3,927,710.52	1,226,503.74	2,483,759.98	756,215.25	8,394,189.49
02.20	20% දීමනාව	8,152,010.40	2,643,265.39	5,241,777.98	1,189,470.30	17,226,524.07
02.21	දීමනාව 10000	1,597,744.52	275,123.33	1,289,689.52	338,829.50	3,501,386.87
02.23	ප්‍රවාහන දීමනාව	577,443.54				577,443.54
02.01	දේශීය	179,451.00	13,468.00	4,880.00	1,000.00	198,799.00
02.02	විදේශීය (සජීත වාර්ෂික, සම්මන්ත්‍රණ ආදී)	84,500.00	-	203,683.25	-	288,183.25
03.01	ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	1,207,945.97	247,752.60	948,700.72	133,819.30	2,538,218.59
03.02	ඉන්ධන හා ලිහිස්සි ද්‍රව්‍ය	1,752,630.72	-	-	-	1,752,630.72

03.03	නිල ඇඳුම් හා මැහුම් ගාස්තු	114,125.63	67,757.50	106,035.38	37,307.50	325,226.01
03.04	යාන්ත්‍රික හා විද්‍යුත් භාණ්ඩ	-	-	3,725.00	-	3,725.00
03.05	රසායනික හා වීදුරු භාණ්ඩ	-	-	42,450.00	-	42,450.00
03.06	වෛද්‍ය සැපයුම්	-	-	351,104.41	-	351,104.41
03.07	වෙනත් සැපයුම්	2,079,314.69	35,285.20	448,230.85	8,406.00	2,571,236.74
04.01	වාහන	1,586,097.17	-	-	-	1,586,097.17
04.02	පිරියත, යන්ත්‍ර හා උපකරණ	374,758.68	97,292.56	218,242.00	32,324.01	722,617.25
04.03	ගොඩනැගිලි හා ව්‍යුහ	3,724,143.39	-	-	-	3,724,143.39
04.04	ගෘහ භාණ්ඩ	-	-	-	-	-
04.05	වෙනත්	9,600.00	-	-	-	9,600.00
05.01	ප්‍රවාහනය	286,630.00	-	-	-	286,630.00
05.02	ජනසංන්නිවේදනය	366,386.56	97,984.15	4,210,275.00	8,313.70	4,682,959.41
05.03	තැපැල් ගාස්තු	147,839.00	-	-	-	147,839.00
05.04	විදුලිය	6,592,180.93	-	-	-	6,592,180.93
05.05	ආරක්ෂක සේවා	13,306,612.05	-	-	-	13,306,612.05
05.06	ජලය	2,057,478.55	-	-	-	2,057,478.55
05.07	පිරිසිදු කිරීමේ සේවා	3,850,185.00	-	-	-	3,850,185.00
05.08	කුලී හා කුලී ගාස්තු	25,219.50	-	-	-	25,219.50
05.09	කුලී හා පළාත් පාලන ආයතනවලට බදු	4,069,341.06	-	-	-	4,069,341.06
05.10	මුද්‍රණ, දැන්වීම් ආදිය	1,971,423.75	152,950.00	16,852.00	-	2,141,225.75
05.11	වෙනත්	8,000.00	-			8,000.00
06.01	විශ්වවිද්‍යාල ගුරුවරුන් සඳහා ප්‍රවාහන ප්‍රදාන	-	-	-	-	-
06.02	විශේෂ සේවා - කවුන්සිල හා කමිටු	743,130.00	109,400.00	55,000.00	-	907,530.00
06.03	විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු	701,500.00	-	12,000.00	7,500.00	721,000.00
06.04	වැඩමුළු, සම්මන්ත්‍රණ	7,000.00	1,000.00	51,550.00	-	59,550.00
06.05	අධ්‍යයන පර්යේෂණ	-	-	2,700.00	-	2,700.00
06.06	කාර්ය මණ්ඩල සංවර්ධනය (ගුරුවරුන් සඳහා පුහුණුව)	576,106.33	82,000.00	120,337.67	-	778,444.00
06.07	පශ්චාත්උපාධි පර්යේෂණ හා ශිෂ්‍යත්වය	-	-	-	-	-
06.08	ශිෂ්‍යයින් හා ඉගෙනුම් සඳහා පාඨමාලා ලේඛණ	-	-	994,500.00	-	994,500.00
06.09	කර්මාන්ත ආධුනිකත්ව, ප්‍රායෝගික පරීක්ෂණ හා වෘත්තීය උපදේශනය	-	-	44,862.00	-	44,862.00
06.10	ශිෂ්‍ය සංවර්ධනය. මූලාරම්භයන් හා කමිටු	-	-	-	-	-
06.11	විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	-	-	4,000.00	-	4,000.00
06.12	ශිෂ්‍ය සුභසාධනය, සේවානියුක්ති	-	-	107,575.00	-	107,575.00

	සුහසාධනය, ශිෂ්‍ය කවුන්සිල					
06.13	සංයුක්ත සැලැස්ම, පාලනය හා දිගුව	308,800.00	-	-	-	308,800.00
06.14	වෙනත් සංවිධානවලට ප්‍රදාන	-	-	-	-	-
06.15	නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශපත්‍ර	231,495.00	56,190.00	103,675.00	33,100.00	424,460.00
06.16	සංග්‍රහ වියදම්	356,838.55	28,224.50	294,042.00	5,000.00	684,105.05
06.17	බැංකු ගාස්තු	569.38	-	-	-	569.38
06.18	ප්‍රදාන හා හානිපූරණ	99,460.61	-	-	-	99,460.61
06.19	දායකත්වය හා සාමාජික ගාස්තු	11,200.00	-	10,000.00	-	21,200.00
06.20	උපාධි ප්‍රදානෝත්සවය	-	-	-	-	-
06.21	විභාග වියදම්	-	-	2,521,115.54	-	2,521,115.54
06.22	වෙනත් - පුවත්පත්, වාරසඟරා ආදිය	1,677,477.00	78,400.00	352,465.00	65,660.00	2,174,002.00
06.23	පශ්චාත්උපාධි පාඨමාලා වියදම්	14,720,019.86		-		14,720,019.86
06.24	සංග්‍රහ දීමනා	190,091.36		126,985,47		317,076.83
06.25	උත්පාදිත අරමුදල් වියදම්	2,008,712.91				2,008,712.91
07.01	මහපොළ ශිෂ්‍යත්වය			3,760,650.00		3,760,650.00
07.02	ශිෂ්‍යාධාර			3,309,930.00		3,309,930.00
08	**ක්ෂයවීම**					
1801	ගොඩනැගිලි	15,976,787,.56	-	-	-	15,976,787.56
1802	ගෘහභාණ්ඩ හා තිරවුරු	2,999,263.26	-	-	-	2,999,263.26
1805	පිරියත හා යන්ත්‍රසූත්‍ර	1,933,908.00	-	-	-	1,933,908.00
1806	කාර්යාල උපකරණ	6,390,270.00	-	-	-	6,390,270.00
1807	පුස්තකාල පොත්	662,485.08	-	-	-	662,485.08
1808	මෝටර් රථ	1,868,941.36	-	-	-	1,868,941.36
1809	විද්‍යාගාරය හා ශික්ෂණ උපකරණ	3,461,847.00	-	-	-	3,461,847.00
	එකතුව	**168,920,674.59**	**17,271,524,.39**	**148,245,517.06**	**11,722,237.84**	**346,159,935.88**

මහපොළ සහ ශිෂ්‍යාධාර හැරුණු කොට මුළු එකතුව 339,089,355.88

අයවැය හා තථ්‍ය සැසඳීම - 2018

	2018 අයවැය රු.	අතිරේක වෙන්කිරීම් මාරු කිරීම රු.	මුළු සංශෝධිත අයවැය රු.	2018 ලැබූ අග්‍රිමය රු	2018 තථ්‍ය වියදම් රු.
මෙහෙයුම් ආදායම					
පුනරාවර්තන ප්‍රදාන	257,000,000	6,500,000	263,500,000	258,430,000	258,430,000
	257,000,000	**6,500,000**	**263,500,000**	**258,430,000**	**258,430,000**
වෙනත් ප්‍රදාන					
වෙනත් ආදායම					
(1) ණය හා අත්තිකාරම්වලින් පොලිය	1,000,000		1,000,000		875,536
(2) විවිධ ලැබීම්	700,000		700,000		439,003
(3) ආයෝජනවලින් පොලිය	7,190,000		7,190,000		17,970,651
(4) ලියාපදිංචි ගාස්තු	450,000		450,000		422,600
(5) විභාග ගාස්තු	50,000		50,000		35,650
(6) පුස්තකලා දඩ	50,000		50,000		39,387
(7) වෛද්‍ය ගාස්තු	25,000		25,000		48,840
(8) දේපලවලින් කුලිය	600,000		600,000		347,945
(9) පැරණි තොග අලෙවිය	100,000		100,000		38,283
(10) පාඨමාලා ආදායම	20,140,000		20,140,000		19,249,464
එකතුව	**30,305,000**		**30,305,000**		**39,467,359**
	287,305,000		**293,805,000**		**297,897,359**
මෙහෙයුම් වියදම්					
(1) පුද්ගල පඩිනඩි	209,480,000	6,500,000	215,980,000	217,230,000	214,342,155
(2) ගමන් වියදම්	1,300,000		1,300,000		486,982
(3) සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ	8,700,000		8,700,000		7,584,591
(4) නඩත්තු	6,230,000		6,230,000	41,200,000	6,042,458
(5) කොන්ත්‍රාත් සේවා	37,400,000		37,400,000		37,167,671
(6) වෙනත් මෙහෙයුම් වියදම්	11,695,000		11,695,000		10,170,950
(7) පාඨමාලා වියදම්	12,500,000		12,500,000		14,720,020
(8) ශිෂ්‍යාධාර	-		-		-
(9) මහපොළ	-	-	-		-
එකතුව	**287,305,000**	**6,500,000**	**293,805,000**	**258,430,000**	**290,514,827**
ප්‍රාග්ධන වියදම්					
පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම	18,000,000		32,000,000	10,000,000	7,869,959
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	12,000,000		28,000,000	15,650,000	10,494,021
ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩ	20,000,000		20,000,000		3,669,139
ඉදිකිරීම් ව්‍යාපෘති - නව	80,000,000		50,000,000		
ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩ (වෙනත්)					19,540,612
	130,000,000		**130,000,000**	**25,650,000**	**41,573,731**
	417,305,000		**423,805,000**	**284,080,000**	**332,088,558**

අයවැය සහ තථ්‍ය සැසඳීම පිළිබඳ ප්‍රකාශනයට සටහන්

1. අයවැය කෘත්‍ය වර්ගීකරණය මඟින් මුදල් පදනම යටතේ අනුමත කරනු ලැබේ. අනුමත අයවැය 2018 ජනවාරි මස 1වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31වැනි දින දක්වා වූ මූල්‍ය වර්ෂය ආවරණය කරයි.

2. අයවැය සහ ගිණුම්කරන පදනම් වෙනස් වේ. සමස්ත ආණ්ඩුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන එකී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇති වියදම් ස්වභාවය මත පදනම් වූ වර්ගීකරණයක් භාවිතා කරමින් උපචිත පදනම මත සකස් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන 2018 ජනවාරි මස 1වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31වැනි දින දක්වා වූ මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා සකස් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන මූල්‍ය පදනමක් මත අනුමත කරනු ලබන අයවැයට වඩා වෙනස් වේ.

3. මුල් අයවැය 2018 ජනවාරි 26වැනි දිනැති කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කරන ලදී.

4. වසර තුළ දී පුද්ගලික පඩිනඩි සඳහා රු. මිලියන 6.5ක පරිපූරක වෙන්කිරීමක් ලැබුනි. 2017 වර්ෂයේ ගෙවිය යුතු බිල්පත් නිරවුල් කිරීම සඳහා අංක 262 දරන පරිපූරක වෙන්කිරීම යටතේ වෙන් කළ රු. මිලියන 80ක ප්‍රග්ධන ප්‍රදාන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2018 ඔක්තෝබර් මස 10වැනි දින වෙනත් උසස් අධ්‍යාපන ආයතන වෙත ප්‍රති-වෙන් කරන ලදී.

5. නව ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන් කළ රු. මිලියන 80ක ප්‍රාග්ධන ප්‍රදානවලින් පිළිවෙලින් රු. මිලියන 30ක, . මිලියන 14ක, සහ . මිලියන 16ක මුදලක් 2018 දෙසැම්බර් මාසය අතරතුර වැය ශීර්ෂ මාරු කිරීම ලෙස ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සහ ස්ථාවර වත්කම් අත්කර ගැනීම සඳහා මාරු කරන ලදී.

6. වසර සඳහා වූ මුළු ප්‍රාග්ධන ප්‍රදානය රු. මිලියන 130ක් වන නමුත් වසර තුළ දී මහා භාණ්ඩාගාරයෙන් ලැබූ තථ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයරු. මිලියන 25.65කි. තථ්‍ය අග්‍රිමය ඉක්මවා සිදු කළ වියදම වසර ආරම්භයේ දී වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානවලින් වියදම් කළ අගය නිරූපණය කරයි.

7. නව ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වූ ප්‍රාග්ධන වෙන්කිරීම කාන්තා නේවාසිකාගාර සංකීර්ණය ඉදිකිරීම සඳහා අත්තිකාරම් ගෙවීම සිදු කිරීම සඳහා 2018 වර්ෂය සඳහා දෙන ලද වෙන්කිරීම නිරූපණය කරයි. කෙසේවුව ද, ඉඩම් ගොඩ කිරීම සඳහා අනුමැතිය දීමේ දී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් වර්ෂය තුළ දී ව්‍යාපෘතිය ප්‍රදානය නොකරන ලදී. මෙම කාර්යය සඳහා කිසිදු අරමුදලක් ලැබී නොමැත.

8. ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩතාව සඳහා වූ ප්‍රාග්ධන වෙන්කිරීම අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් වැඩ සඳහා දෙන ලද වෙන් කිරීම නිරූපණය කරයි. වර්ෂය තුළ දී ඉහත ඉදිකිරීම් වැඩවල කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ ඔහුට ගෙවිය යුතු මුදල් ඉල්ලා සිටිමින් කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී. විශේෂ පාලන ගිණුමක් හරහා ඉහත කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය යුතු රු. 3,669,139ක මුදල නිදහස් කිරීම සඳහා පියවර ගෙන ඇත. කෙසේවුව ද, 2018 දෙසැම්බර් 31වැනි දින වන විට කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා ඉහත ගිණුමේ රු. 6,488,942.18ක මුදලක් විය.

16. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/E/GWAI/1/18/04
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2019 මැයි 30 දින

නිසි බලධාරී
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රයෝජනවත් ජීවිත කාලය අනුව ක්ෂය කර අවසන්ව ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා වත්කම් ප්‍රත්‍යාගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වුවද දැනට භාවිතයේ පවතින 2018 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම ශුන්‍ය වූ හා පිරිවැය රු.43,215,814 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක පාරිතෝෂික ගණනය කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 19 ප්‍රකාරව ගණනය කිරීම් සිදුකර නොතිබුණි. 2019 වර්ෂයේදී එයට අනුකූලව කටයුතු කරන බව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර තිබුණි.

(ඇ) විද්‍යායතනය විසින් භාවිතා කරනු ලබන ආයතනයට අයත් පර්චස් 243.9 ක් වූ බිම් කැබලි 3 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණු බැවින් ආයතනය සතු ඉඩම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනය අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, නීතිරීති, විධිවිධානවලට යොමුව	විස්තරය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු 13 දිනැති අංක 862/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 5 ඡේදය	අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා නිලබලයෙන් පත්වන විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපතිවරයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත්කළ නියෝජිතයෙකු 2018 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකම රැස්වීම් වාරයක් සඳහාවත් සහභාගිවී නොතිබුණු අතර නියමාවලියේ 5 ඡේදය ප්‍රකාරව කටයුතු කර ඒ වෙනුවට වෙනත් සාමාජිකයෙකු පත්කර ගෙන නොතිබුණි.

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ වූ ආපසු ගෙවිය යුතු රඳවාගැනීම් හා විවිධ ඇප තැන්පතුවල වටිනාකම රු.15,093,438 ක් වූ අතර ඉන් රු.812,269 ක් වූ ශේෂයන් වර්ෂ 3- 5 ක් අතර කාලයක් පැරණි ශේෂයන් විය.

(ආ) විද්‍යායතනයේ ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම සඳහා 2010 වර්ෂයේදී රු.824,000 ක් වැයකර පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදීගෙන තිබුණු නමුත් වත්කම් මිලදී ගැනීම් සම්බන්ධ තොරතුරු පමණක් අදාළ පද්ධතියට ඇතුළත් කර තිබුණි.

(ඇ) 2013 සැප්තැම්බර් 12 දින නිදහස් දීමනාවකින් විද්‍යායතනයට පවරාදී තිබුණු හෙක්ටයාර් 2.3533 ක බිම් ප්‍රමාණයකින් යුත් වතුපිටිවල පිහිටි ඖෂධ උද්‍යානය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන ආකාරයට නිසි සැලැස්මක් යටතේ සංවර්ධනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේදී කායවර්ධන මධ්‍යස්ථානය සඳහා රු.1,118,750 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණද එහි උපදේශකවරයෙකු නොමැති බැවින් මෙම උපකරණ ඵලදායී ආකාරයෙන් පරිහරණය කිරීමට සිසුන්ට නොහැකි වී තිබුණි.

(ඉ) ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 134.4 ක් වූ මෙම අධ්‍යයන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භයේ සිට මන්දගාමී තත්ත්වයේ පැවති බව ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා අනුව අනාවරණය විය. 2016 අගෝස්තු 31 දින සිට 2018 මැයි 31 දින දක්වා වරින්වර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාලය වසර දෙකකට ආසන්න කාලයකට දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් කරන ලද මුදල රු.13,332,311 ක් විය. 2018 පෙබරවාරි 25 දින සිට කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු නවතා දමා කොළඹ වාණිජ අධිකරණයේ නඩුවක්ද ගොනුකර තිබුණි.

(ඊ) විද්‍යායතනයේ සිසුන් 600 කට අධ්‍යයන පහසුකම් ඇතිකර තිබුණද, 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපනය හදාරන සිසුන් සංඛ්‍යාව 398 ක් වූයෙන් උපයෝජනය සියයට 66 ක් විය. දේශීය වෛද්‍ය විෂය ප්‍රචලිත කිරීම විද්‍යායතනයේ මූලික අරමුණක් වුවද රටට අවශ්‍ය දේශීය වෛද්‍යවරුන් බිහිකිරීමේ කාර්යය අපේක්ෂිත මට්ටමක නොතිබීමෙන් විද්‍යායතනයේ සම්පත් ඌන උපයෝජිතව පැවතුණි.

2.5 වෙනත් නිරීක්ෂණ

(අ) රුපියල් මිලියන 79 ක ඇස්තමේන්තුවකට වර්ග මීටර් 990 ක මහල් 04 කින් යුත් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද වැඩ ආරම්භ කිරීමේදී එය වර්ග මීටර 1,475 ක් දක්වා වැඩිකර තිබුණත්, ඒ සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සරිලන පරිදි විෂය ක්ෂේත්‍ර සංශෝධනය කිරීම්, නවීන ක්‍රම හා නව සොයාගැනීම් සහ නව ඉගැන්වීම් ක්‍රම ඔස්සේ දේශීය වෛද්‍ය විද්‍යාව දියුණු කළ යුතු විය. වර්තමානයේදී දේශීය වෛද්‍ය විද්‍යාවේ වැදගත්කම හා එහි විශ්වාසවන්තභාවය පිළිබඳ ජනතාව තුළ ආකල්පමය වශයෙන් සංවර්ධනයක් ඇතිකිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් ක්‍රියාත්මක කළ යුතු විය. මේ සඳහා විද්‍යායතනයේ කථිකාචාර්යවරුන් පර්යේෂණ වල නියැලීම ඉතාමත් වැදගත් කාර්යභාර්යයක් බව නිරීක්ෂණය විය. ඒ අනුව, වර්තමානයේ විද්‍යායතනයට කථිකාචාර්යවරුන් 34 දෙනෙකු අනුයුක්තව සිටියද ඔවුන් 2017 සහ 2018 වර්ෂවල පර්යේෂණ සඳහා යොමු වී නොතිබුණි.

(ඇ) සිසුන් දේශනවලට සහභාගී වීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් කථිකාචාර්යවරයෙකු 2017 වර්ෂයේ අගෝස්තු සිට දේශන සඳහා සහභාගී වී නොතිබුණු අතර එම කථිකාචාර්යවරයාගේ දේශන ආවරණය කිරීම සඳහා 2017 නොවැම්බර් 22 දින සිට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගෙන තිබුණි. 2018 වර්ෂයේදී මේ වෙනුවෙන් බාහිර දේශන ගාස්තු ලෙස රු.148,500 ක් වැයකර තිබුණු අතර 2019 පෙබරවාරි 28 දින වනවිට අදාළ කථිකාචාර්යවරයා දේශන, විභාග රාජකාරි සහ අධ්‍යයන මණ්ඩල සඳහා සහභාගී නොවී මාස 18 කට වැඩි කාලයක් ගතවී තිබුණි. මෙම කාලසීමාව සඳහා ඔහුට සියළු දීමනා සමඟ වැටුප් ලෙස රු.3,336,200 ක් ගෙවා තිබුණි.

(ඈ) ආයතනය ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අනුව ඉලක්ක 9 ක් යටතේ කාර්යයන් 90 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඉන් කාර්යයන් 36 ක් ඉටුකර ගෙන නොතිබුණු අතර ඉටුකළ කාර්යන් 7 ක ප්‍රගතිය සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි.

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ඉගැන්වීම්, පුහුණු කිරීම් හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරයන් හා ශිෂ්‍යයන් හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විද්‍යායතනයේ කාර්යභාර්යයක් වුවද එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2017/2018 අධ්‍යයන වර්ෂයේ විද්‍යාපති පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලාව සහ සහතික පත්‍ර පාඨමාලා 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 04 ක් සහ විද්‍යාපති පාඨමාලා 02 ක් පමණක් පවත්වා තිබුණි.

(උ) ආයුර්වේද ආයතන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හා විද්‍යාපති පාඨමාලාව 2013/2014 අධ්‍යයන වර්ෂයෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණු අතර පංචකර්ම විද්‍යාපති හා ශල්‍යතන්ත්‍ර පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 අධ්‍යයන වර්ෂයෙන් පසු ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු සජ්ත වාර්ෂික නිවාඩු හා කථිකාචාර්යවරුන් 09 ක් අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණු බැවින් හා අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවති බැවින් අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලයේ සියයට 53 ක පමණ ඌනතාවයක් තිබුණි.

(එ) 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වේ. සමාලෝචිත වර්ෂය වන විට ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ඉලක්ක හඳුනාගෙන තිබුණද, අදාළ කාර්ය ඉටු කිරීම සඳහා අයවැය ආශ්‍රිත වාර්ෂික සැලසුම්වලට ඒවා ඇතුළත් කිරීම, දර්ශක සකස් කිරීම හා සංධිස්ථානයන් හඳුනා ගැනීම සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

17. අධ්‍යක්ෂකගේ වාර්තාව

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
கம்பஹா விக்கிரமாராச்சி ஆயுர்வேத நிறுவனம்
களனிப் பல்கலைக்கழகம், இலங்கை
GAMPAHA WICKRAMARACHCHI AYURVEDA INSTITUTE
UNIVERSITY OF KELANIYA, SRI LANKA

මගේ අංකය / எனது இல / My No. පීඩබ්ජ්අයි/වි.වි/2018   ඔබේ අංකය / உமது இல / Your No.

2019.08.15

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් එවනු ලැබූ ඔබගේ අංක එච්ඊඩී/ඊ/පීඩබ්ජ්අයි/1/18/04 දරණ 2019.05.30 දිනැති 2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා බැඳේ.

එම වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ 2019.08.02 දින පැවති මෙම විද්‍යායතනයේ 267 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සළකා බැලීමෙන් අනතුරුව පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන් ක්ෂය වී පවතින වත්කම් නිවැරදිව හඳුනා ගැනීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර, එම කටයුතු අවසන් වීමෙන් පසු ප්‍රත්‍යාගණනය කළයුතු වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්ගත කිරීමට අපේක්ෂිතයි.

එසේම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධව මෙතෙක් ගෙන ඇති පියවර පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

විද්‍යායතනයේ සියලුම මෝටර් රථ තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මේ වන විට ලබා දී ඇති අතර ඉදිරියේදී එම වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු යොදා ඇත. තවද ඉඩම් ගොඩනැගිලි ගිණුම් ගත කිරීමට අවශ්‍ය ආකාරයට වටිනාකම් වෙන් වෙන්ව තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එම වත්කම් වෙන්වෙන්ව හඳුනා ගැනීමට හැකිවන ලෙස තක්සේරු කර දෙන ලෙස එම

1

අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director +94 33 2222739 Fax +94 33 2222739 directorgwai@kln.ac.lk
නියෝජ්‍ය ලේඛකාධිකාරී / பிரதி பதிவாளர் / Deputy Registrar +94 33 2226618 Fax +94 33 2226618 drgwai@kln.ac.lk
නියෝජ්‍ය මූල්‍යාධිකාරී / பிரதி நிதியாளர் / Deputy Bursar +94 33 2223785 Fax +94 33 2223785 dbgwai@kln.ac.lk
සාමාන්‍ය / பொது / General +94 33 2222740 +94 33 2222748
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග හා ශිෂ්‍ය සුභසාධන) / [illegible] / Senior Assistant Registrar (Exam & Student Welfare) +94 33 2223784 Fax +94 33 2223784 sargwai@kln.ac.lk
සහකාර මූල්‍යාධිකාරී (සැපයුම්) / [illegible] / Assistant Bursar (Supplies) +94 33 3135830 Fax +94 33 2223785 abgwai@kln.ac.lk
වෙබ් පිටුව / இணையத்தளம் / Web Site gwai.kln.ac.lk

දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. මේ සම්බන්ධයෙන් එම ආයතනය සමඟ නිරන්තරයෙන් කටයුතු කරමින් පවතී. එසේම අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතුද සිදු කරමින් පවති.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති පරිදි 2019 වර්ෂයේදී ප්‍රමිත අංක 19 පරිදි කටයුතු කිරීමට නියමිතව ඇත.

(ඇ) ආයතනයට අයත් පර්චස් 243.9 ක් වූ බිම් කැබලි ගිණුම් තැබීමේ අවශ්‍යතාවය සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ නමුදු එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද තක්සේරු වාර්තාව ගිණුම් තැබීමේ අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සකස් වී නොමැති වීම හේතුවෙන් හඳුනා ගැනීමේ ගැටළුවක් පවතී. එබැවින් මෙම ඉඩම් හා ගොඩනැගිලි නැවතත් තක්සේරු කිරීමට අවධානය යොමු කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 එකඟ වේ.

2.2 **නීති,නීතිරීති,විධිවිධාන වලට යොමුව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු 13 දිනැති අංක 862/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ නියමාවලියේ 5 ඡේදය

විස්තර

එකඟ වෙමි.

2018 වසරේ මැයි මස 11 වෙනි දින සිට වසර 3ක කාලයක් සඳහා පත්කරන ලද ආයතනයේ කළමනාකරණ මණ්ඩලය සඳහා නිලබලයෙන් පත්වන විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ පීඨාධිපතිවරයා අදාළ කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී නොවීම හේතුවෙන් එම රැස්වීම් සඳහා සහභාගී වන මෙන් දන්වා 2019.05.21 දිනැති ලිපියක් යොමු කර ඇති අතර ඒ සම්බන්ධයෙන් 2019.05.02 දිනැතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමාද දැනුවත් කර ඇත. 2019.07.24 දිනැතිව අදාළ පීඨාධිපතිවරයා විසින් පිළිතුරු ලිපියක් මඟින් අදාළ රැස්වීම සඳහා සහභාගී නොවීමට හේතුවූ කරුණු පිළිබඳව දැනුම් දී ඇත. එම කරුණු සලකා බැලූ විට වෛද්‍ය පීඨ පීඨාධිපතිවරයාගේ නියෝජනය මෙම විද්‍යායතනයේ කළමනාකරණ මණ්ඩල

රැස්වීම් වෙත ලබා ගැනීම ප්‍රායෝගිකව ගැටළු සහගත බැවින් විද්‍යායතනයේ නියමාවලියේ 9(F) ඡේදය වෙනස් විය යුතු බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා යැවීමට කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කළමනාකරණ මණ්ඩලයට පත් කරන ලද සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සාමාජිකභවතා 2018 වර්ෂයේ මැයි මස සිට රැස්වීම් වාර තුනක් සඳහා පැමිණිය නොහැකි බව දන්වා එවා තිබූ අතර ඉන්පසුව පැවැත්වූ රැස්වීම් සඳහා සහභාගී වී නොතිබුණි. මේ පිළිබඳව 2019.05.02 දිනැතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කිරීමෙන් පසුව එම සාමාජිකභවතා වෙනුවට එම අමාත්‍යාංශයේම වෙනත් නිලධාරියෙකු 2019.05.17 දින පත්කර එවා ඇති අතර එම සාමාජිකභවතා 2019 මැයි මාසයේ සිට කළමනාකරණ රැස්වීම් වාර 2කට නොකඩවා සහභාගී වී ඇත.

2.3 එකඟ වේ.

2.4 (අ) 2018.12.31 වන දිනට රඳවා ගැනීම් හා විවිධ ඇපතැන්පත් ලෙස පවතින වටිනාකම් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමෙන් පසු නිදහස් කිරීමටත් එසේ නොවන රඳවා ගැනීම් හා තැන්පතු ආදායමට ගැනීමටත්, අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.

(ආ) දැනට පවතින ස්ථාවර වත්කම් වලට අදාළ පරිගණක මෘදුකාංගය වසර 09ක් පමණ පැරණි වන අතර එය තාක්ෂණික වශයෙන් දුර්වල තත්ත්වයක පවතින බැවින් ආයතනය විසින් එම මෘදුකාංගය යාවත්කාලීන කරමින් පවතී. ඒ අනුව දැනට පවතින පරිගණක මෘදුකාංගයෙහි පවතින දත්ත ඒ අංශවල පවතින ඉන්වෙන්ට්‍රි ලේඛන සමඟ සැසඳීම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මේ වන විට අංශ කිහිපයක කටයුතු නිමකර ඇත. තවදුරටත් පවතින ශේෂ හා අපහරණය කරන ලද වත්කම් නිවැරදිව හඳුනාගෙන යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. එම කටයුතු නිම කළ පසු නව මෘදුකාංගය වෙත දත්ත ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ. තවද ආයතනය තුළ පවතින සියලුම වත්කම් වලට අදාළව ඒ ඒ අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛන හා අනෙකුත් වත්කම් ලේඛන පවත්වාගෙන යන අතර ඒ සියලුම වත්කම් වාර්ෂිකව සමීක්ෂණයට භාජනය කරනු ලබයි. 2018 වර්ෂයේ සිදුකරන ලද අවසන් වත්කම් සමීක්ෂණ වාර්තා අනුව සැලකිය යුතු ඌනතාවයන් වාර්තා වී නොමැති බවටද පෙන්වා දෙමි.

(ඈ) වතුපිටිවල ඖෂධ උද්‍යානය විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන සඳහා ප්‍රයෝජනවත් ආකාරයට සංවර්ධනය කිරීමට වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කොට ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් පවතී.

(ඈ) විද්‍යායතනයට ශාරීරික උපදේශකවරයකු බඳවා ගැනීම සඳහා අයදුම් පත් කැඳවා සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති අතර එහි ප්‍රතිඵල මත තෝරා ගන්නා ලද අයඳුම්කරුට කළමනාකරණ මණ්ඩලය නිර්දේශ ලබාගෙන ඇති අතර එම නිර්දේශ කැලණිය විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයට යොමු කිරීමෙන් අනතුරුව එහි අනුමැතියද ලද පසු අදාළ පත්වීම ලබාදීමට නියමිතය.

(ඉ) මෙම කාර්යය සඳහා 2014.11.07 දින ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කළද එහි අයිතිකරු 2014.12.24 දින හදිසියේ අභාවප්‍රාප්තවීම හේතු කොටගෙන එම ආයතනයේ පරිපාලන කටයුතු මෙන්ම මූල්‍යමය අයිතිය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයකට මුහුණදී එය නිරවුල් කරගැනීමට උසාවි නියෝගයක් ලබාගැනීමට සිදුවීම නිසා ඉදිකිරීම් ව්‍යාපෘති නිසියාකාරව පවත්වා ගෙනයාමට නොහැකි වූ බව එම ආයතනයේ නව පරිපාලනය විසින් දන්වන ලදී.

මෙම තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අධ්‍යයන කටයුතු සඳහා වූ එම ගොඩනැගිල්ල ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය මත 2018.05.31 දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018.01.16 දින ලිපිය මගින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද එහිදී පනවා තිබූ කොන්දේසි මත ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු කටයුතු කළද කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද ගාස්තු ලෙස රඳවා ගත් හිඟ මුදල් එකවර ඉල්ලා සිටි අතර පසුව කාර්යය අත්හැර කාර්යය සාධන බැඳුම්කර හා අත්තිකාරම් ඇප බැඳුම්කර මුදල් කිරීම තහනම් කිරීමේ නියෝගයක් ඉල්ලා කොළඹ වානිජ අධිකරණයේ නඩුවක් පවරණ ලදී.

මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙනයාමේදී මුහුණපෑමට සිදු වූ අනපේක්ෂිත වාතාවරණය හේතුකොට ගෙන සැලසුම් කළ කාල පරාසය තුළ ගොඩනැගිල්ල ඉදිකිරීමට නොහැකි වුවත් එහිදී දැරීමට සිදුවන අමතර පිරිවැය ඇස්තමේන්තු කර කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරගෙන යමින් පවතී. එහි නඩු වාර 05 ක් මේ වනවිට පවත්වා ඇති බව සඳහන් කරමි.

(ඊ) එක් අධ්‍යයන වර්ෂයකට ශිෂ්‍යයන් 120ක් බඳවා ගැනීමට පහසුකම් පැවතියද එම ප්‍රමාණයම ඇතුළත් කර ගැනීමට නොහැකිවීමට කරුණු රැසක් බලපා ඇත. විශ්වවිද්‍යාල ප්‍රවේශය යටතේ විද්‍යායතනයට ඇතුළත් කර ගනු ලබන්නේ උසස්

පෙළ විද්‍යා විෂය ධාරාව හැදෑරූ සිසුන් පමණි. ඔවුන් විද්‍යා විෂය ධාරාව හැදෑරීමෙන් බලාපොරොත්තු වන්නේ බටහිර වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා ඇතුළත් වීමටය. එහෙත් එම උත්සහයන් අසාර්ථක වූ සිසුන් ඊට පහළින් ඇති පාඨමාලා සඳහා අයදුම් කරයි.

එහිදී ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සඳහා ඇතුළත් කර ගන්නා Z අගය ඉතා පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඒ සඳහා අයදුම් කරන ශිෂ්‍යයන්ගේ ප්‍රමුඛතාව ඒ සඳහා යොමු නොවීමට බලපා තිබේ. තවද රජයේ වෛද්‍යවරයකු වීමට ගතවන කාලය වැනි හේතූන් ද අයදුම් කරන ශිෂ්‍ය ප්‍රමාණය අවම වීමට හා විෂයට පවතින ආකර්ශනය අවම වීමට බලපා තිබේ. එමෙන්ම පසුගිය කාලය පුරාවට විද්‍යායතනයේ පැවති ගැටලුකාරී තත්ත්වයන් ද විද්‍යායතනයට පැවති ආකර්ශනය අඩුවීමට බලපාන්නට ඇත.

කෙසේ නමුත් මෑත කාලීනව විද්‍යායතනයේ භෞතික සම්පත් වර්ධනය කිරීම, ගුණාත්මක අධ්‍යාපන වටපිටාවක් සකස් කිරීම, සමාජමය වශයෙන් ආයුර්වේදයේ වටිනාකම පිළිබඳව දැනුවත් කිරීමේ හා සමාජ සත්කාරමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී විද්‍යායතනය මඟින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2016/2017 අධ්‍යයන වර්ෂයට සිසුන් 109ක් ඇතුළත් කරගැනීමට හැකි වී ඇත. මෙයට අමතරව 2016/2017 අධ්‍යයන වර්ෂය වසරකින් දීර්ඝ කරගත් සිසුන් දෙදෙනෙකු ද ඇතුළත් ව 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා මේ වන විට සිසුන් 111ක් ලියාපදිංචි කරගැනීමට ද හැකි වී ඇත.

ශිෂ්‍ය සංඛ්‍යාව

අධ්‍යයන වර්ෂය	ශිෂ්‍ය සංඛ්‍යාව					එකතුව
	I වසර	II වසර	III වසර	IV වසර	V වසර	
2016/2017	109	68	67	86	68	398

ඒ අනුව ඉදිරියේ දී විද්‍යායතනයේ දැනට සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව වන 398න් 68ක් මේ දිනවල පැවැත්වෙන අවසන් වසර විභාග සම්පූර්ණ කර විද්‍යායතනයෙන් ඉවත් වී යන අතර 2017/2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 111ක් විද්‍යායතනයට ඇතුළත් වනු ඇත. එමගින් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 441ක් දක්වා ඉහළ යන අතර එමගින් දැනට 66% ක පවතින සම්පත් උපයෝජනය ද 73.5%ක් දක්වා වර්ධනය වනු ඇත. තව ද ආයතනය මගින් ගනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් ඉදිරියේ දී මෙම තත්ත්වය තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.5 (අ) විගණන වාර්තාවෙන් පෙන්වා ඇති පරිදි අදාළ අනුමැතිය ලබාගැනීම සඳහා 2019.06.11 දිනැතිව නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපියට පිළිතුරු 2019.06.25 දිනැති ලැබී ඇති අතර එම ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ කොටස් ආයතනය ඉපයූ අරමුදලින් සිදු කරන ලෙස දක්වා ඇත.

(ආ) විගණන වාර්තාව මඟින් පසුගිය වසර වල ආචාර්ය මණ්ඩලය පර්යේෂණ සඳහා යොමු නොවී ඇති බව පෙන්වා තිබුණද 2018 වර්ෂයේ පර්යේෂණ සම්භාෂා (Research Symposium) සඳහා සහ පර්යේෂණ සඟරා (Research Journals) සඳහා පර්යේෂණ පත්‍රිකා 35ක් ඉදිරිපත් කර තිබුණි. එසේම පර්යේෂණ කමිටුවක් 2018 වර්ෂයේ පිහිටුවා එමගින් පර්යේෂණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන්, වැඩමුළු ක්‍රියාත්මක කොට ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පර්යේෂණ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා සායනික පර්යේෂණ ව්‍යාපෘති 5ක් ලැබී ඇත. එම ව්‍යාපෘති 5 සඳහා සදාචාරාත්මක නිෂ්කාශනය (Ethical Clearance) ලබා ගැනීමට යොමු කර ඇත.

තවදුරටත් වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ කටයුතු දිරිගැන්වීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට එම ක්ෂේත්‍රයේ පර්යේෂණවල නියැලෙන වෙනත් විශ්වවිද්‍යාල සමඟ වැඩමුළු සංවිධානය කර ඇති අතර පර්යේෂණ කමිටුව හරහා ඉදිරිපත් වී ඇති පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය මැන බැලීමටද අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

(ඇ) මේ සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේදී සාකච්ඡා කළ අතර අදාළ ප්‍රශ්නය නිරාකරණය වනතුරු තාවකාලික කථිකාචාර්යවරුන්ගේ සහයෝගයෙන් එම පුරප්පාඩුව සපුරා ගන්නා ලෙස දන්වා ඇත. අදාළ කථිකාචාර්යවරයා දේශන වලට සහභාගී නොවුවද විෂයමාලා සංශෝධනය සඳහා මූලිකත්වය ගෙන කටයුතු කර ඇති අතර අධ්‍යනාංශයේ අනෙකුත් අධ්‍යයන කටයුතු වෙනුවෙන්ද තම දායකත්වය නොමඳව ලබාදී ඇත. තවද එම ආචාර්යවරයා 2019.05.01 දින සිට සප්ත වාර්ෂික නිවාඩු ලබා ඇති අතර නිවාඩු අවසානයේ රාජකාරියට වාර්තා කළ පසු අදාළ දේශන සඳහා යොමු කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි 2018 වසරට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අවම මට්ටමකට පැවතීමට ආයතනික ගැටළු රැසක් බලපා ඇති අතර විද්‍යායතනයේ එවකට සිටි අධ්‍යක්ෂකවරයාගේ ඉල්ලා අස්වීමද ඊට

සෘජුවම බලපා තිබුණි. එමෙන්ම ශිෂ්‍ය වර්ජනය පැවතීමත්, සැලසුම් කළ පරිදි අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමත් නිසා ඉහත අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී ඇත.

(ඉ) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණද 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් ශිෂ්‍යයන් හුවමාරු කිරීමේ වැඩසටහනක් සැලසුම් කොට අධ්‍යයන මණ්ඩලයේ සහයෝගය අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. ඒ සඳහා අදාළ නිර්ණායක නිර්ණය කිරීම සඳහා කමිටුවක්ද මේ වන විට පත් කොට ඇත.

(ඊ) ශල්‍යතන්ත්‍ර විද්‍යාපති පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් තරම් අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී නොතිබීමත් ආයුර්වේද ආයතන කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාවේ විෂය සංශෝධන එම වර්ෂවලදී සිදුකෙරෙමින් පැවතීමත් මෙයට හේතු වී ඇත.

(උ) ආයුර්වේද ආයතන කළමනාකරණ හා පරිපාලනය පිළබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හා විද්‍යාපති පාඨමාලාව සඳහා අයදුම් පත් කැඳවුවද ප්‍රමාණවත් අයදුම්පත් නොලැබුනු බැවින් පාඨමාලා ආරම්භ කිරීමට නොහැකිවිය.

(ඌ) මෙම විද්‍යායතනයේ දෙපාර්තමේන්තු දෙකක ආචාර්යවරුන් දෙදෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබුණද ඔවුන්ගේ එම රාජකාරී කොටස් වෙනත් ආචාර්යවරුන් දෙදෙනෙකු විසින් ආවරණය කර තිබුණි. පශ්චාත් උපාධි සුදුසුකම් ලැබිය යුතු වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 09 දෙනා අතුරින් දෙදෙනෙක් අදාළ අධ්‍යයන කටයුතු අවසන් කර මේ වන විට නැවත සේවයට වාර්තා කර ඇත.
තවද ආචාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු තනතුරු 15න් දෙකක් සඳහා මේ වන විට බඳවා ගැනීම් සිදුකර ඇති අතර ඉතිරි පුරප්පාඩු වලට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමටද කටයුතු සිදුකරමින් පවති.

(එ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"ප්‍රකාරව ගුණාත්මක අධ්‍යාපනයක් සිසුන්ට ලබාදීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු වී ඇති අතර එම අරමුණු ඉටු කර

ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය සැලසුමට ඇතුළත් කර ඇත. එම අරමුණු ඉටු කිරීමට අවශ්‍ය වන කාර්යය දර්ශක හා සංධිස්ථාන හඳුනා ගැනීමට අවධානය යොමු කර ඇත.

මේජර් ජනරාල් (විශ්‍රාමික) එච්.එම්. උදය බණ්ඩාර හේරත් ආර්එස්පී යූඑස්පී වීඑස්වී
නිසි බලධාරී

පිටපත් :-

1. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
2. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. ලේකම් - නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - යක්කල

2018

තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව

01. තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම සඳහා නිකුත් කරන ලද පහත චක්‍රලේඛ මගින් එම කරුණු පිළිබඳව විද්‍යායතනය දැනුවත් විය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017.07.25 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017 චක්‍රලේඛය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක BD/CBP/4/1/2-2018 දරණ 2017.07.31 දිනැති ලිපිය

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරණ 2017.08.14 දිනැති ලිපිය

02. උක්ත චක්‍රලේඛ, ලිපි සහ වෙනත් මාධ්‍ය මගින් වසර 2030 න්‍යාය පත්‍රයේ අප විද්‍යායතනයට අයත් සහ එහි දැක්ම සහ මෙහෙවර යටතේ අදාල වන කොටස් වෙත අවධානය යොමු විය. ඒ අනුව එම අරමුණු 17 න් 4 වන අරමුණ වන ගුණාත්මක අධ්‍යාපනයක් යන්න මූලික වශයෙන් හඳුනාගන්නා ලදී. ඒ යටතේ විද්‍යායතනයේ ප්‍රථම උපාධිය සඳහා ලියාපදිංචි සිසුන් 120 ක් පවත්වාගෙන යාම, විද්‍යායතනය මගින් සිදු කරන ප්‍රථම උපාධි මට්ටමට පහළ පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වැඩි සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීම, ඒවායේ ගුණාත්මක බව ඉහළ නැංවීම සහ නව පාඨමාලා ආරම්භය, සිසුන්ගේ සහ සේවකභවතුන්ගේ සුභසාධක පහසුකම් සහ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම ආදී කරුණු දැක්විය හැකිය.

03. මෙම අරමුණු සහ ඉලක්ක සහ මිනුම් දර්ශක (KPI) ආයතනයේ 2018 වර්ෂයේ සැලසුම් වෙත ඇතුළත් කර ඇත. තවද රජය විසින් 2018 වර්ෂයේ දී නව ප්‍රතිපත්තිමය උපාය මාර්ග 03 කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වා ඇත. එනම් 1. තිරසර සංවර්ධන අරමුණු 2. ස්ත්‍රී පුරුෂ සමානභාවයට අනුකූල වූ අයවැයකරණය 3. ආබාධිත පුද්ගලයන් සවිබල ගැන්වීම කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් කටයුතු කිරීමට උත්සහ දරා ඇත.

ඉලක්කය	පරමාර්ථය	පියවර	ප්‍රධාන කාර්යසාධන දර්ශක	තිරසාර සංවර්ධන ඉලක්ක
1 ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය බවට පත්වීම	1.1 අධ්‍යයන විශිෂ්ටතාව ඉහළ නැංවීම	1.1.5 ප්‍රජා පාදක සේවා ඉගෙනුම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම	ප්‍රජා පාදක ව්‍යාපෘති සඳහා වෙන් කළ කාලයෙන් %	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම
		1.1.3.1 තාක්ෂණික විෂයධාරාව සඳහා නව ප්‍රථම උපාධි වැඩසටහන් පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම සහ 4වැනි ඉලක්කය
		1.1.3.2 නව විහිදුම් පාඨමාලා පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	
		1.1.3.3 නව පශ්චාත් උපාධි/ ඩිප්ලෝමා වැඩසටහන් පිරිනැමීම	ආරම්භ කළ පාඨමාලා සංඛ්‍යාව	
		1.1.3.4 දැනට ඇති වැඩසටහන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ නැංවීම	ලියාපදිංචි කළ ශිෂ්‍ය සංඛ්‍යාව	

		1.1.3.5 ශිෂ්‍ය හැරයාම අඩු කිරීම	වසරකට හැරයන ශිෂ්‍යයින් සංඛ්‍යාව	
		1.1.3.6සාම්ප්‍රදායක වෛද්‍ය වෘත්තිකයින්ට වෘත්තීය අධ්‍යාපනයට ප්‍රවේශවීමට ඉඩප්‍රස්ථා සැලසීම	සාම්ප්‍රදායක වෛද්‍ය වෘත්තිකයින් සංඛ්‍යාව. වසරකට ලියාපදිංචි කළ %	
	1.3 ප්‍රමිති, සායන හා වෘත්තීය පුහුණුව හරහා ආයුර්වේද අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	1.3.1.2 විවිධ ප්‍රදේශවල සායනික පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම/ පුළුල් කිරීම	පවත්වන ලද සායනික පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	
		1.3.1.3 වෘත්තීය පුහුණුව වැඩිදියුණු කිරීම/ පුළුල් කිරීම	පවත්වන ලද වෘත්තීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	
2 ශ්‍රී ලංකාව තුළ ආයුර්වේදය පිළිබඳ විශිෂ්ට පර්යේෂණ මධ්‍යස්ථානයක් බවට පත්වීම	2.1 ප්‍රමිති, සායන හා වෘත්තීය පුහුණුව හරහා ආයුර්වේද අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	2.1.2.2 බහු-විෂය පර්යේෂණ දිරිමත් කිරීම	වසරක දී සිදු කළ බහු-විෂය පර්යේෂණ සංඛ්‍යාව	සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම
		2.1.2.3 විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන ආදිය සමග පර්යේෂණ සහයෝගීතාවන් ඇති කර ගැනීම	වසරක දී ඇති කර ගත් සහයෝගීතා සංඛ්‍යාව	
5 ආයුර්වේදය, යුනානි සහ සිද්ධි යන වෛද්‍ය ක්‍රම තුනේ නියැලි ශිෂ්‍යයින් සහ වෘත්තිකයින් අතර සන්නිවේදනය, අන්තර්ක්‍රියාකාරීත්වය සහ අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීම	5.1 ආයුර්වේදය, යුනානි සහ සිද්ධි යන ප්‍රධාන සාම්ප්‍රදායක වෛද්‍ය ක්‍රම තුන අතර සහයෝගීතාව වැඩිදියුණු කිරීම මගින් ආචාරවිද්‍යාත්මක සංගතිය ප්‍රවර්ධනය කිරීම	5.1.1.1 උසස් අධ්‍යාපන ආයතන අතර ශිෂ්‍ය/ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් පැවැත්වීම	"වසරක දී පවත්වන ලද හුවමාරු වැඩසටහන් සංඛ්‍යාව"	සෞඛ්‍ය හා අධ්‍යාපනය සහ සාමය ගොඩනැගීම සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම (16වැනි ඉලක්කය)

		5.1.1.2 බහු-විෂය පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම	වසරක දී පවත්වන ලද බහු-විෂය පර්යේෂණ සංඛ්‍යාව	
		5.1.1.3 යුනානි හා සිද්ධි වෛද්‍ය ක්‍රම පිළිබඳ ඒකාබද්ධ සෞඛ්‍ය කඳවුරු/ පුහුණු වැඩසටහන් පැවැත්වීම	වසරක දී පවත්වන ලද ඒකාබද්ධ සෞඛ්‍ය කඳවුරු සංඛ්‍යාව	
		5.1.1.4 යුනානි හා සිද්ධි වෛද්‍ය ක්‍රම පිළිබඳ ඒකාබද්ධ විනෝදක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	පවත්වන ලද විනෝද ක්‍රීඩා වැඩසටහන් සංඛ්‍යාව	
6 කාර්යක්ෂම හා ඵලදායී පරිපාලන හා මූල්‍ය කළමනාකරණයක් හරහා පාලනය ඉහළ නැංවීම	6.1 වසර 2020 දී කාර්යක්ෂම පාලන ක්‍රමයක්	6.1.1.3 අධ්‍යයන ගොඩනැගිල්ලක් ඉදිකිරීම (AC2)	ඉදිකිරීම් කටයුතුවලින් %ක් නිමා කර ඇත.	ආබාධිත පුද්ගලයින්ට ඇති ප්‍රවේශය ඉහළ නැංවීම සහ 4වැනි ඉලක්කය
		6.1.2.7 හරිත හා තිරසාර මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම	හඳුන්වා දෙන ලද හරිත මූලාරම්භ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	7වැනි ඉලක්කය

04. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් මෙම විද්‍යායතනය මඟින් 2018 වසරේදී ගෙන තිබේ.

(I) විද්‍යායතනයේ දෛනික රාජකාරී කටයුතු සඳහා ආයතනික දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රම බලකාය වෙත බඳවාගැනීම් සිදු කිරීමේදීත් පුරප්පාඩු පිරවීමේදීත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඇත.

(II) එමෙන්ම විද්‍යායතනයේ කාර්යය මණ්ඩල සාමාජිකාවන්ගේ ආරක්ෂාවට වඩාත් හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා රාත්‍රී 6 න් පසුව රාජකාරී කටයුතු සිදු කිරීම අවම කිරීමට කටයුතු යොදා ඇති අතර අත්‍යවශ්‍යම අවස්ථා වලදී පමණක් රාත්‍රී 6 න් පසුව රාජකාරී කටයුතු වල යෙදවීමට සිදු වුවහොත් ඔවුන්ගේ ගමනාන්ත සඳහා ප්‍රවාහන පහසුකම් සපයා දීමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා හැකිතාක් දුරට කාන්තා අධීක්ෂක නිළධාරීන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු යොදා ඇත.

(III) එමෙන්ම කාර්යයන් ඉටු කිරීමේදී ඉතා සමාන කාර්යයභාර්යයක් කාන්තා නිළධාරීන් වැඩි දෙනෙක් අතරේ බෙදා දීම මඟින් රාජකාරී කාලය තුළ ඉතා කාර්යක්ෂමව තමන් වෙත පවරා ඇති රාජකාරී කටයුතු ඉටු කළ හැකි පරිසරයක් නිර්මාණය කර ඇත.

05. දත්ත පවත්වා ගැනීම යටතේ සේවක පිළිබඳ දත්තයන් පාලන අංශයෙන් ද සිසුන් පිළිබඳ දත්තයන් විභාග සහ ශිෂ්‍ය සුභසාධන අංශය යටතේ ද පවත්වාගෙන යනු ලබයි. තවද අප ආයතනයේ ද ස්ත්‍රී පුරුෂභාවය වෙන් කර ඉහත දත්ත ලබා ගත හැකි ය.

06. එමෙන්ම තිරසාර සංවර්ධන අරමුණු යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය යටතේ ස්ත්‍රී, පුරුෂ, ජාති, ආගම්, කුල බේදයකින් තොරව උසස් අධ්‍යාපනය ලබා ගැනීමට සහ එමගින් ළගා කර ගත හැකි ප්‍රතිඵල අත් විඳීමට සම අවස්ථාවන් මෙම විද්‍යායතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ළගා කර දීමට කටයුතු යොදා ඇත.

07. එමෙන්ම පරිසරය රැක ගැනීමටත් ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමටත් භූමි ඛාදනය වළක්වා ගැනීමටත් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ කාර්යය මණ්ඩලය විසින් සුවිශේෂි කැප වීමක් කොට තිබේ.

(I) විද්‍යායතනයේ විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වන ඖෂධ ශාක රෝපනය කිරීම හා ඒවා හොඳින් රැක බලා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වතුපිටිවල පිහිටි අක්කර 6 ක භූමි භාගයක ඖෂධ උද්‍යානයක් ද පවත්වා ගෙන යනු ලැබේ.

(II) පරිසර සංරක්ෂණයට දායක වීමේ අරමුණින් වාර්ෂිකව ඖෂධ පැළ සිටුවීමේ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මන කරනු ලබන අතර විද්‍යායතනයේ සිසුන් විසින් වාර්ෂිකව සංවිධානය කරන ලද දන්සැලේ දී ඒ සඳහා සහභාගී වූ පිරිස් වෙත ඖෂධ පැළ හා කොස් පැළ බෙදා දීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

(III) එමෙන්ම කැළි කසළ පරිසරයට බැහැර කිරීමෙන් වන පරිසර හානි අවම කිරීම සඳහා විද්‍යායතනයේ එක් රැස් වන කසළ රැස් කොට කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ද මේ වන විට අරඹා ඇති අතර ඉන් ලබා ගන්නා කාබනික පොහොර විද්‍යායතයේ වගාවන් සඳහා භාවිතා කරමින් පරිසර හිතකාමී වටපිටාවක් සකස් කිරීම සඳහා ඉමහත් කැපවීමක් කරනු ලැබේ.

08. සෑම මුදල් වසරක් අවසානයේ දීම මෙම කාර්යන්ගේ ප්‍රගතිය මැනීම තොරතුරු ලබාගැනීමේ පත්‍රයක් මගින් පාලන අංශයෙන් ලබා ගන්නා අතර ඒවා ඉදිරි වසරේ තීරණ සහ ඉලක්ක හඳුනාගැනීම සඳහා භාවිතා කරයි.

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - ශ්‍රී ලංකාව

கம்பஹா விக்ரமாராச்சி ஆயுர்வேத நிறுவகம் - இலங்கை

Gampaha Wickramarachchi Ayurveda Institute - Sri Lanka

gwai.kln.ac.lk